සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| 08 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | 11 S |
|---|---|---|
| නම: ............................................ | **බුද්ධ ධර්මය** | **කාලය පැය දෙකයි** |

**සැලකිය යුතුයි.**

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
  එක් ප්‍රශ්නයකට ලකුණු 2 ක බැගින් ලකුණු 40 ක් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ලෝකවාසි බෞද්ධයන්ගේ ප්‍රධාන ආගමික උත්සවය වන්නේ,
(1) පොසොන් උත්සවය. (2) වෙසක් උත්සවය. (3) කඨින උත්සවය (4) ඇසල උත්සවය.

(02. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,
(1) රතන සූත්‍රයයි. (2) කරණීය මෙත්ත සූත්‍රයයි. (3) මහා මංගල සූත්‍රයයි. (4) ධම්සක් පැවතුම් සූත්‍රයයි.

03. බුදු ගුණ සිහි කරමින් වඩනු ලබන භාවනාවකි.
(1) ආනාපානාසති භාවනාව (2) පිළිකුල් භාවනාව (3) මෛත්‍රී භාවනාව (4) බුද්ධානුස්සති භාවනාව

04. තමාගේ කටයුතු පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු හෙයින් ධර්මය
(1) අකාලික වන්නේය. (2) සන්දිට්ඨික වන්නේය. (3) ඕපනයික වන්නේය. (4) ඒහිපස්සික වන්නේය,

05. ශ්‍රී ලංකාවාසී ජනතාවට බුදු දහම හඳුන්වාදීමට මුලිකත්වය ගත්තේ,
(1) මිහිඳු තෙරුන්ය. (2) සැරියුත් තෙරුන්ය. (3) මුගලන් තෙරුන්ය. (4) සංඝමිත්තා තෙරණියයි.

- අංක 06 සිට 10 තෙක් දී තිබෙන ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. බුත්සරණ නම් කෘතිය තොටගමුවේ රාහුල හිමියන් විසින් රචනා කරන ලද්දකි. (      )

07. අස්සජි හිමියන්ගෙන් ධර්මය අසා උපතිස්ස කෝලිත දෙමිතුරෝ බුදු දහම වැළඳගත්හ. (      )

08. පරිමණ්ඩල යනුවෙන් අදහස් කරන්නේ හාත්පසින් වට කොට සිවුරු හැඳීම හා පෙරවීමයි. (      )

09. කාවන්තිස්ස රජතුමා එළාර රජු සමග සටන් කොට බුදු දහම සහ ශ්‍රී ලංකාව බේරා ගැනීමට උත්සුක වුයේය. (      )

10. පළමු ධර්ම සංගායනාව පවත්වා අවසන් කිරීමට ගත වූ කාලය මාස නවයකි. (      )

- අංක 11 සිට 15 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.
( මුගලන් රහතන් වහන්සේ, අණන සුඛය, අජාසත්ත රජු, උම්මග්ග, කාම තණ්හාව )

11. ............................................... යනු තමා අල්ප වශයෙන් හෝ ණයක් නැතැයි සිතා සතුටු වීමයි.

12. බුද්ධ කාලීන භාරතයේ පියා මැරීමෙන් පසු රාජ්‍යත්වයට පත් වූයේ ................................................... ය.

13. මනු ලොව දෙව්ලොව හා නිරයේ සැරිසරමින් කරනු ලබන පින් පවුවල විපාක පිළිබඳව දේශනා කරනු ලැබුයේ ....................................................... ය.

14. බුදු දහමට අනුව කම්සැප විඳීමට ඇති ආශාව සහ කැමැත්ත හඳුන්වන්නේ ................................ වශයෙනි.

15. බෝසතාණන් වහන්සේගේ උපාය කෞශල්‍ය ප්‍රකට කෙරෙන්නේ .................................... ජාතක කතාවෙනි.

- පහත A තීරුවේ දැක්වෙන වචනයට ගැළපෙන අංකය B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අංකය ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.

| | A | | B |
|---|---|---|---|
| 16. | බුදුන් වහන්සේට වෛර කළ අයෙකි. | ( ) | 1 ගිරග්ග සමජ්ජ |
| 17. | උපතිස්ස කෝලිත දෙදෙනා නැරඹූ නාට්‍ය සංදර්ශනය | ( ) | 2 චූල්ල පන්ථක |
| 18. | පන්සිය පනස් ජාතක කතා පොත් වහන්සේ රචනා වූ යුගය | ( ) | 3 හිරි ඔත්තප්ප |
| 19. | රජෝ හරණං රජෝ හරණං යනුවෙන් බුදුන් දවස භාවනාවක් ලෙස හුරු කළේ | ( ) | 4 කුරුණෑගල |
| 20. | පවු කිරීමට ඇති ලැජ්ජාව සහ බය | ( ) | 5 දේවදත්ත |

(ලකුණු 2X20 = 40)

## II කොටස

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.
   I. බුදුන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය කුමක්ද?
   II. සිරිත් හා විරිත් යන දෙක හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
   III. "පෙකනිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා" යන කවියේ ඉතිරි - පද දෙක සම්පූර්ණ කරන්න.
   IV. බුද්ධ චරිතයෙන් පිළිඹිබු වන ආචාරශීලී ගුණාංග දෙකක් නම් කරන්න.
   V. සුද්ධෝදන මහාරජතුමා විසින් බුදුන් ඇතුළු භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීම සඳහා ඉදිකළ ආරාමයේ නම කුමක්ද?
   VI. ප්‍රඥාවන්තයින් සහ ඍද්ධිමතුන් අතර අග තැන්පත් තෙරවරුන් දෙදෙනා නම් කරන්න.
   VII. සිවුවනක් පිරිස නම් කරන්න.
   VIII. ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර යන කවිය ඇතුළත් වන කාව්‍ය ග්‍රන්ථය කුමක්ද ?
   IX. වචනයෙන් සිදුවන වැරදි දෙකක් ලියන්න.
   X. බුදුන් වහන්සේගේ අවසාන ශ්‍රාවකයා කවුද?.

(ලකුණු 2X10 = 20)

02. I. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට පෙර දින , රහත් වූ තෙරුන් වහන්සේගේ නම කුමක්ද? (ලකුණු 02)
   II. ප්‍රථම ධර්ම සංගායනාවේ මූලිකත්වය , අනුග්‍රාහකත්වය හා පැවැත්වූ ස්ථානය නම් කරන්න . (ලකුණු 03)
   III. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමෙන් ලැබූ ප්‍රතිඵල පිලිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05)

03. I. යස්ස පාපං කතං කම්මං කුසලේන පිථීයති යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
   II. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)
   III. ශිෂ්‍ය ජීවිතය ආලෝකමත් කර ගැනීමට ධම්ම පද ගාථාවලින් ලැබෙන මග පෙන්වීම පෙන්වා දෙන්න. (ලකුණු 05)

04. I. සිගාලෝවාද සූත්‍රයේදී හිත මිතුරු සම්බන්ධතාවය සහ අඹු සැමි සම්බන්ධතාව උපමාකොට ඇති දිශාවන් දෙක පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)
   II. බිරිඳ විසින් සැමියාට ඉටු කල යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)
   III. කළණ මිතුරු ඇසුර යහපත පිණිසත්, නරක මිතුරු ඇසුර අයහපත පිණිසත් හේතු වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. I. චතුරාර්ය සත්‍යයෙහි සඳහන් දෙවන ආර්ය සත්‍ය නම් කරන්න. (ලකුණු 02)
   II. තණ්හාවේ ප්‍රභේද තුන ලියන්න. (ලකුණු 03)
   III. තණ්හාවට (ආශාවට) ගිජුවීමෙන් වර්තමාන සමාජයේ මිනිසුන් විවිධ විපත්වලට මෙන්ම ප්‍රශ්නවලට මුහුණ දුන් අවස්ථා 5 සඳහන් කරන්න. (ලකුණු 05)

06. I. සප්ත අපරහානිය ධර්ම අනුගමනය කළ රාජ්‍ය නම් කරන්න. (ලකුණු 02)

II. සප්ත අපරහානිය ධර්ම වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

III. යහපත් රාජ්‍ය පාලනයක් සඳහා සප්ත අපරහානිය ධර්ම ඉවහල්වන අකාරය පැහැදලි කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. අවමංගල්‍ය චාරිත්‍ර

II. කර්මය

III. පස්පවින් වළකිමු

IV. දළදා වහන්සේ

(ලකුණු 5X2 = 10)